# ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය (SLTDA)

## SLTDA සතු ඉඩම් සඳහා සංචාරක ව්‍යාපාර ආයෝජන සඳහා අභිලාෂ ප්‍රකාශ කිරීම (EOI)







**ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය (SLTDA), විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය හා එක්ව තිරසාර සංචාරක ආයෝජන සඳහා සුදුසු ප්‍රමුඛ ඉඩම් කළඹක් ඇති බව සතුටින් නිවේදනය කරයි. ආසියාවේ ප්‍රමුඛතම සංචාරක ගමනාන්තයක් බවට පත් වීමේ ශ්‍රී ලංකාවේ දැක්මේ කොටසක් ලෙස, SLTDA විසින්, විවිධ ඉහළ විභවයක් සහිත ප්‍රධාන භූගෝලීය සහ තේමාත්මක සංචාරක ප්‍රදේශවල පිහිටා ඇති මෙම ඉඩම් පෞද්ගලික අංශයේ සංවර්ධන කටයුතු සඳහා පිරිනමනු ලැබේ.**

**පහත විස්තර කොට ඇති පරිදි, අක්කර 3,000 ට වඩා වැඩි මෙම ඉඩම් දිගු කාලීන (අවුරුදු 30) බදු පදනම මත පිරිනමනු ලැබේ.**

### කල්පිටිය<br>දූපත් නිවාඩු නිකේතනය

1. බත්තලන්ගුණ්ඩුව දූපත - අක්කර 291 ක් පමණ
   - අනුමත ක්‍රියාකාරකම්

     පාරිසරික / ස්වභාවික / ත්‍රාසජනක (Eco/ Nature/Adventure) සංචාර, ජල ක්‍රීඩා, අනුමත කරන ලද ස්ථානයන්හි මුහුදේ නෑම, වෙරළ ක්‍රීඩා, විනෝද චාරිකා, කඳවුරු හෝ ප්‍රජාව සමග සහයෝගයෙන් වෙනත් ඕනෑම ගැළපෙන ක්‍රියාකාරකමක්.
2. උච්චමුනෙයි දූපත - අක්කර 1,095 ක් පමණ
   - අනුමත ක්‍රියාකාරකම්

     සී ප්ලේන් (Sea Plane), වරායක්, යාත්‍රා (Yachat) වරායක් සහ නිකේතන වරායක් සහිත ඒකාබද්ධ නිවාඩු නිකේතනයකට සුදුසුයි. කිමිදුම් සම්බන්ධයෙන් විශේෂත්වයක් උසුලන, කිමිදුම් පාසලක් සහිත නිවාඩු නිකේතනය. පරිසර / ස්වභාවික / ත්‍රාසජනක (Eco/Nature/ Adventure) සංචාර, ජල ක්‍රීඩා, අනුමත කරන ලද ස්ථානයන්හි මුහුදේ නෑම, වෙරළ ක්‍රීඩා, විනෝද චාරිකා, කඳවුරු, හෙල්ත් ක්ලබ් සහ ස්පා, ඇතුළු ක්‍රීඩා සහ විනෝදාස්වාද පහසුකම්. ගෝල්ෆ් පිටිය, ඩ්‍රයිවින් රේන්ජ්, අශ්වයින් පැදීමේ පාසල සහ ප්‍රජාව සමග සහයෝගයෙන් වෙනත් ඕනෑම ගැළපෙන ක්‍රියාකාරකමක්

දූපත් දෙකම සඳහා

- කාමර ඝනත්වය : හෙක්ටයාරයකට කාමර 25
- උපරිම ගොඩනැගිලි ප්‍රමාණය : භූමියෙන් 25%
- නිර්දේශිත උස : වෙරළ තීරයට මුහුණලා තනි මහල් ව්‍යුහයන් ඉදිකිරීම, දූපත් ප්‍රදේශයේ G+3 (උපරිම උස මීටර 15 යි)

### අලස් ගාර්ඩින්, ත්‍රිකාණාමලය

- අක්කර 1-2 පරාසයක් සහිත බහුවිධ ඉඩම් කොටස් සහිත අක්කර 4 ක් පමණ
- නාගරික අවන්හලක් හෝ බුටික් වර්ගයේ තානායමක් සඳහා වඩාත් ගැළපේ.
- ප්‍රදේශයේ පවතින ලක්ෂණවලට අනුකූල වන පරිදි සැලසුම් නිර්මාණය කර ඇති පරිසර හිතකාමී ගොඩනැගිල්ලක්

### දෙද්දූව<br>ලේක් නිවාඩු නිකේතන ප්‍රදේශය

- අක්කර 1,713 ක පමණ භූමි ප්‍රදේශය
- නවාතැන්, ත්‍රාසජනක, සුවතා සහ විවේක ක්‍රියාකාරකම් ඒකාබද්ධ විභවයක් සහිත ඒකාබද්ධ නිවාඩු නිකේතන ව්‍යාපෘතියකට සුදුසුය.
- ජල මාර්ග වෙන් කිරීම් අදාළ වන අතර භූමිය ආවරණය උපරිම 50% යි.
- ගොඩනැගිලි උස සීමාව : G+2 (මුදුන තෙක් මීටර 12)
- ඉඩම් කොටස් බොහෝ ප්‍රමාණයක්, ජල තලා, ගස් හා වන ක්ෂේත්‍ර සහිත වනාන්තර භූ දර්ශන හෝ අතහැර දැමූ කුඹුරු යායකට මුහුණලා ඇති බැවින්, තේමාව ස්වභාවධර්මය හා තදින් බැඳුණු එකක් විය යුතුය.
- ව්‍යාපෘතිය පරිසරයට අනුකූල විය යුතු අතර ප්‍රජාව සමග සහයෝගයෙන් කටයුතු කිරීමේ ක්‍රියාකාරකම් තිබිය යුතුය.

### බුලනයාය, පිදුරංගල

- තනි ආයෝජකයෙක් සඳහා අක්කර 17 ක ඉඩම.
- පරිසර හිතකාමී සැලසුම් සමග ස්වභාවිකත්වය සහ සංස්කෘතිය පදනම් කරගත් සංචාරක ව්‍යාපාරයක් සඳහා ඉහළ විභවයක් ඇත.
- සීගිරියට සහ පිදුරංගලට ආසන්නව පිහිටා ඇත.
- උපරිම ගොඩනැගිලි ප්‍රදේශය 30%
- උපරිම ගොඩනැගිලි උස : මීටර 10 යි (බිම් මහල + 1 මහල)

### බෙන්තොට<br>ජාතික නිවාඩු නිකේතනය

- අක්කර 1 සිට 3 දක්වා පරාසයක් සහිත උපායමාර්ගිකව පිහිටා ඇති බිම් කොටස්, ආසන්න වශයෙන් අක්කර 24 ක් පමණ.
- නිවාඩු නිකේතන සංවර්ධනය සහ සංස්කෘතික සංචාර සඳහා වඩාත් සුදුසු වේ.
- උපරිම ගොඩනැගිලි ප්‍රදේශය 30%
- උපරිම ගොඩනැගිලි උස වෙරළ තීරයට මුහුණලා ඇති ඉඩම් සඳහා වහලය මත ඇති ටැංකි සහ කුලුනු ද සහිතව මීටර් 14 යි. (බිම්මහල + මහල් 2)
- නවතම වෙරළ සංරක්ෂණ කළමනාකරණ සැලසුම් පිළිපැදීම සහ පාරිසරික තිරසරභාවය සලකා බැලීම අත්‍යවශ්‍ය වේ.

### රසූල් තොට්ටම් - ත්‍රිකුණාමලය

- අක්කර 2-5 පරාසයක් සහිත බහුවිධ ඉඩම් කොටස් සහිත දළ වශයෙන් අක්කර 40 ක් පමණ.
- පරිසර හිතකාමී සැලසුම් සමග ත්‍රාසජනක - සංස්කෘතික අත්දැකීම් පදනම් වූ හරිත සංචාරක ව්‍යාපාරයක් සඳහා වඩාත් සුදුසුවේ.
- උපරිම ගොඩනැගිලි ප්‍රදේශය 30%
- උපරිම ගොඩනැගිලි උස : වහලය මත වූ ටැංකි සහ කුලුනු සහිතව මීටර 12 ක් විය යුතුය. (බිම් මහල + මහල් 2)

### කුච්චවේලි<br>වෙරළ නිවාඩු නිකේතනය

- අක්කර 3 - 10 පරාසයක් සහිත බහුවිධ ඉඩම් කොටස් සහිත අක්කර 74 ක්
- පරිසර සහ බුටික් විලා, වෙරළ අද්දර සංචාරක හෝටල්, ජල ක්‍රීඩා සහ විනෝදජනක ක්‍රියාකාරකම් හෝ වන වෙරළ (Jungle beach) නිවාඩු නිකේතනයක් සඳහා සුදුසු වේ.
- අනුමත කරන ලද උපරිම ගොඩනැගිලි ප්‍රදේශය 30%
- ගොඩනැගිලි උස පරිශ්‍රයේ පිහිටි මධ්‍ය ප්‍රමාණයේ ගස්වල උස නොඉක්මවිය යුතුය. ආසන්න වශයෙන් අඩි 18 (තනි මහල්) සහ අඩි 28 (දෙමහල්) (ගෙබිම සිට වහලයේ මුදුන තෙක්)

### පාසිකුඩා<br>ජාතික නිවාඩු නිකේතනය

- වේගයෙන් සංවර්ධනය වෙමින් පවතින නිවාඩු නිකේතන ප්‍රදේශයක පිහිටි අක්කර 6-5 ප්‍රමාණයේ වෙරළ අද්දර බිම් කොටස්.
- පරිසර හිතකාමී සැලසුම් සහිතව ඉහළ මට්ටමේ තරු පන්ති හෝටලයක් සඳහා වඩාත් සුදුසු වේ.
- උපරිම ගොඩනැගිලි ප්‍රදේශය 30%
- උපරිම ගොඩනැගිලි උස : වහලය මත වූ ටැංකි සහ කුලුනු සහිතව මීටර 15 ක් (බිම් මහල + මහල් 3)

### යෝජනා ඉදිරිපත් කිරීම :

උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ට, ඇගයීම සඳහා මූලික සංකල්ප යෝජනා ඉදිරිපත් කළ හැකි අතර කෙටි ලැයිස්තුගත අපේක්ෂකයින්ට සවිස්තරාත්මක යෝජනා ඉදිරිපත් කිරීම සඳහා ආරාධනා කරනු ලැබේ.

- මුද්‍රා තබන ලද යෝජනා (අනුපිටපතක් සහිතව) පහත ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නැතහොත් අතින් ගෙනවිත් භාරදිය යුතුය.

  සභාපති,<br>දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,<br>ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය,<br>අංක 80, ගාලු පාර, කොළඹ 03.
- මෙම දැන්වීම පළ වූ දින සිට දින 45 ක් ඇතුළත යෝජනා ඉදිරිපත් කළ යුතුය.
- කවරයෙහි ඉහළ වම් කෙළවරෙහි "EOI - සංචාරක සංවර්ධනය - යෝජිත ඉඩම්" යන්න සඳහන් කළ යුතුය.
- ඉඩම් පිහිටීම් කිහිපයක් සඳහා අයදුම් කරන්නේ නම්, වෙන් වෙන්ව අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.
- දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසාන තීරණය වේ.
- වැඩිදුර තොරතුරු සඳහා www.sltda-gov.lk වෙබ් අඩවිය වෙත පිවිසෙන්න.

### යෝජනා ඇගයීමේ නිර්ණායක

- නිර්මාණශීලීත්වය සහ ලෝක මට්ටමේ සංචාරක නිෂ්පාදන සමග සංසන්දනය කිරීම.
- පාරිසරික අනුකූලතාව සහ තිරසාර බව (පුනර්ජනනීය බලශක්තිය, ජල ප්‍රතිචක්‍රීකරණය සහ කසළ කළමනාකරණය)
- සංකල්පයේ විශේෂත්වය සහ හොඳම පාරිසරික භාවිතාවන් යෙදවීම.
- ඉහළ මට්ටමේ සංචාරක අවශ්‍යතා නිර්මාණය කිරීමට ව්‍යාපෘතිය සතු හැකියාව.
- ව්‍යාපෘති රැකියා උත්පාදනය සහ ප්‍රජා ප්‍රතිලාභ.
- ආයෝජන පරිමාණය සහ මූල්‍යකරණ සහ අලෙවිකරණ හැකියාවන් නිරූපණය කිරීම. (ආයෝජනයෙහි සම්පූර්ණ ආයෝජන ප්‍රතිලාභය (ROI) සහ ශ්‍රී ලංකාවේ සන්නාම තත්ත්වයට සහාය වීම.)
- සමාගම් පැතිකඩ (Profile) සහ සමාන ස්වභාවයේ ව්‍යාපෘති පිළිබඳ පළපුරුද්ද.

**සභාපති,**<br>**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**<br>**ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය,**<br>**අංක. 80, ගාලු පාර, කොළඹ 03.**